"සිංහල වාක් ශක්තියේ විශිෂ්ට ඵලය 'කව්සිළුමිණ' මහා කාව්‍යය ද වාග් ලාවණ්‍යයේ විශිෂ්ට ඵලය 'සැළලිහිණි සන්දේශය' ද වේ." මෙම ප්‍රකාශය, සුප්‍රකට ලේඛක කේ. ජයතිලක මහතා විසින් සම්පාදිත, 'විමර්ශන සහිත කව්සිළුමිණි මහා කාව්‍යය' නම් කෘතිය ආරම්භයේ සඳහන් වන්නකි. සිංහල සාහිත්‍යය විශේෂයෙන්ම සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යය ගෙන බලන විට, 'කව්සිළුමිණ' අගතැන්තිලා සැළකිය හැකිය යන්න විවාදයෙන් තොරව කිව හැක්කකි. එමෙන්ම සුන්දර ලෙස, රසවත් ලෙස මෙන්ම ව්‍යක්ත ලෙස ද වදන් පරිහරණය කරමින්, කෝට්ටේ යුගයේදී සිරි රහල් මාහිමියන් විසින් රචිත 'සැළලිහිණි සන්දේශය' සිංහල සන්දේශ කාව්‍ය අතර ප්‍රමුඛස්ථානය දරන කාව්‍යය ද වේ. මෙලෙසින් 'කව්සිළුමිණ' ගැන සඳහන් කරන අතරතුර, ජාතක සාහිත්‍යයෙන් උපුටා ගත් 'උම්මග්ග ජාතකය' නැතහොත් 'උමංදාව', 'නැණසිළුමිණ' නමින් හඳුන්වන්නට මෙකල අප අතර සිටින වියතුන්ගෙන් කෙනකු වන, මහාචාර්ය දර්ශන රත්නායක යොමු වී ඇත.

මීට පෙර 'දූත ගීතය' ආදී අගනා කෘති රැසක් පාඨකයා වෙත ඉදිරිපත් කරමින් සිය කවිත්වය ද පාණ්ඩිත්‍යය මෙන්ම පුළුල් භාෂා ඥානය ද එමතු නොව තමන් සතු නිර්මාණ කුසලතාව ද ප්‍රකට කර ඇති මෙතුමා මෙවර අපගේ දැනුමට හා රස වින්දනයට ද යොමු කර ඇත්තේ තවත් අගනා කෘතියකි. 'නැණ සිළුමිණ නම් උමංදානන්දය' යනුවෙන් තම කෘතිය නම් කිරීමෙන් ද කතුවරයා සිය රස වින්දන ශක්තියට පාඨකයා ද හවුල් කරගැනීමට දරා ඇති ප්‍රයත්නයක් ප්‍රකට වෙයි.

මෙවන් කෘතියක් සම්පාදනයෙහිලා මුල් වූ තම අභිලාෂය ගෙන හැර දැක්වීමේදී ද කතුවරයා අදාළ ග්‍රන්ථයෙන් මතු කෙරෙන මහෞෂධ පඬිතුමන්ගේ අතිවිශිෂ්ට ඥාන සම්භාරය, දාන ශීලාදී ගුණ සමුදාය ආදී විවිධ අංශ කෙරෙහි පාඨක අවධානය යොමු වන පරිද්දෙන් සංක්ෂිප්ත හැඳින්වීමක් කර ඇත්තේ මෙසේය :

"ප්‍රඥා ප්‍රදීප වූ ජනානන්දකර වූ සරණාගත වප්‍රපසාදජර වූ මහෞෂධ පණ්ඩිතයන්ගේ දානයෙන් ශීලයෙන් පරිත්‍යාගයෙන් ඍජුභාවයෙන් ක්ෂාන්තියෙන් අවිරෝධතාවෙන් සමුපලක්ෂිත වූ දශ රාජධර්ම සංකල්ප හා සංචරණය විශද කිරිම උදෙසා"
(7 පිට)

සාහිත්‍යය වූ කලි විශ්වසාධාරණ බවකින් ද සර්වකාලීන අගයකින් ද යුත් නිර්මාණ අන්තර්ගත වන සෙස්තුයකි. උම්මග්ග ජාතකය විෂය කොටගෙන ඇති කතා පුවතෙහි ද මූලික වශයෙන් අපේක්ෂිත බෞද්ධාගමික මුහුණුවර මගින් මතු කර දක්වන දේ මෙන්ම සර්වකාලීන අගයකින් යුත් අදහස්, උදහස්, සමග විවිධ ධර්මතා ද ඇතුළත් වෙයි. රාජ්‍ය පාලනය සඳහා එදාටත්, අදටත්, මතුවටත් හැම කල්හිම අදාළ වන, අවශ්‍ය වන ලක්ෂණ මහෞෂධ පඬිතුමන්ගේ සිත තුළ මෙන්ම ක්‍රියා කලාපයෙහි ද දක්නට ලැබුණ බව බෞද්ධ පාඨකයා හොඳින්ම දනී. ඉහතින් දැක්වූ උද්ධෘතයෙහි සඳහන් වන, දශ රාජධර්ම සංකල්පය එකලටත් වඩා වර්තමානයට අත්‍යවශ්‍ය වන්නකි. එවැනි තත්වයක් අනුව මෙවන් කතා පුවතක් පාඨකයාගේ රස වින්දනයට යෝග්‍ය වන පරිද්දෙන් නව නිර්මාණයක් ලෙස පද්‍යයෙන් ඉදිරිපත් කිරීමට මෙම කතුවරයා තරම් සමත් විය හැකි අන් අය වෙතොත් ඒ අල්ප වශයෙනි.

මෙම කෘතියෙහි පසු පිටෙහි දැක්වෙන කෙටි හැඳින්වීම ද කෘතිය පිළිබඳවත් කතුවරයා පිළිබඳවත් වැදගත් කරුණු කීපයක් ගෙන හැර දක්වයි. "දිගු කලක් තිස්සේ වැඩුණු කාව්‍ය සම්ප්‍රදාය ද කවියේ විවධ ප්‍රවණතා ද සාවධාන ව නිරීක්ෂණය කිරීමෙන් අගනා නිර්මාණ සම්පත් උපයාගත හැකි බව මෙම කාව්‍යයෙන් සනාථ කෙරේ. සඳැස් කාව්‍ය රචනයෙහි විශේෂ කුසලතා ඇති කවියෙකුට සිය ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා භාෂා නෛපුණ්‍යය අනුව ඉටු කළ හැකි නිර්මාණ මෙහෙවර ද මෙයින් අවබෝධ කරගත හැකිය. . . . . ." මේ අනුව බලන විට රටක, කිසියම් සාහිත්‍යයක, දීර්ඝකාලීනව වර්ධනය වෙමින් පැවති කාව්‍ය සම්ප්‍රදායක් අධ්‍යයනයෙන් පසුව සිය කුසලතා මෙන්ම භාෂා නිපුණතාව ද උපයෝගී කරගනිමින් ඇතැම් කෘතීන් පාඨක රසාස්වාදයට අවකාශ සැලසෙන පරිද්දෙන් නව නිර්මාණ ලෙස බිහි කළ හැකි බව මහාචාර්ය දර්ශන රත්නායක මැනවින් ඔප්පු කර ඇත.

කව්සිළුමිණ බඳු මහාකාව්‍යයකින් සිව්වග පල සම්පත් අපේක්ෂා කෙරුණ බව කිව හැකිය. එවන් අරමුණු ද සිත්හි තබාගෙන නූතන අවදියේ පාඨකයාට යෝග්‍ය වන පරිද්දෙන් ද ඔවුනට විෂය වන පරිද්දෙන් ද කාලෝචිත නිර්මාණයක් කිරීමට 'නැණසිළුමිණ නම් උමංදානන්දය' කතුවරයා ගත් උත්සාහය සැබවින්ම පළ දරා ඇත. ජාතක කතා පොදුවේ ගත් විට ද ඒවායෙහි යල් පැන ගිය ස්වරූපයකට වඩා සර්වකාලීන වටිනාකමක් ඇති බවට විවාදයක් නොමැත. ඒ අතර උමංදාව විශේෂයෙන්ම

සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

"නැණසිළුමිණ නම් උමංදානන්දය"

එදාට මෙන්ම අදටත් ඉදිරි අනාගතයටත් කොතරම් නම් අදාළ වන්නේද යන්න ගැන ද වඩාත් හොඳින් අවබෝධ කරගන්නට පාඨකයාට ඉඩ සැලසීමක් 'නැණසිළුමිණ නම් උමංදානන්දය' කෘතියෙන් සිදු වී ඇත.

උම්මග්ග ජාතකය කියවන සැදැහැවත් පාඨකයා, මහෞෂධ පඬිතුමාගේ උත්පත්ති අවස්ථාවේදී සිදු වූ හාස්කම ගැන දෙවරක් නොසිතා පිළිගනු ඇත. ඊට අමතරව බුද්ධිමත් ලෙස එම කරුණ ගැන සිත යොමු කරන පාඨකයා ද එහි ඇති විස්මිත බව පෙන්වන බාහිර ලක්ෂණ ගැන අනවශ්‍ය තර්ක විතර්ක ඉදිරිපත් කරනු වෙනුවට ජාතක කතාවෙහි අන්තර්ගතය, එහි මතු වන ගැඹුරු කරුණු, අදහස්, ආකල්ප යනාදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු තිසැකය. " බෝසතුන්ගේ ප්‍රඥා මහිමය පිළිබිඹු කෙරෙන උමංදාව අද්‍යතන කවියෙකුගේ කාව්‍යකරණය සඳහා උචිත කාව්‍යානුභූතියක් වන්නේ එහි පවතින සර්වකාලීන හා සාර්වත්‍රික අගය තිසාය. සංකීර්ණ දේශපාලනික, සාමාජික හා සංස්කෘතික පරිස්ථිතියකින් හෙබි මෙම කථා වස්තුවෙන් විද්‍යාව හා අවිද්‍යාව, මිථ්‍යාව හා සත්‍යය, මිනිස්කම හා නොමිනිස්කම, සත්භාවය හා අසත්භාවය අතර පවතින නිරන්තර ගැටුම නිරූපණය වේ.. . . . . ." යනාදී වශයෙන් මෙම කෘතියට 'මං පෙත' යනුවෙන් සපයා ඇති පෙරවදනෙහිදී ද උමංදාව, වර්තමාන සමාජයට වුව කොතරම් දුරට ගැළපෙන, අදාළ කථා වස්තුවක් ඉදිරිපත් කරයිද යන්න මොනවට පැහැදිලි කර ඇත. බුදුන් වහන්සේ ජීවමානව වැඩ විසූ කාලය තුළ කොතරම් නම් මිනිස්කම හඳුනන අය මෙන්ම නොළුසේව, නොමිනිස්කම ප්‍රකට කළ අය ද ජීවත් වූවෝදැරේ ධර්මය හා අධර්මය අතර නිරන්තර ගැටුම් එදා මෙදා තුර මිනිස් සමාජයෙහි පවතින ඒවාය. මිථ්‍යාව හා සත්‍යය යන එකිනෙකට පටහැනි ධර්මතාවන්හි එල්බ ගන්නවුන් කොතෙකුත් මිනිස් සමාජයෙහි එදත් අදත් ජීවත් වන බව ද අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙවන් පසුබිමක ජන්ම ලාභය හිමි කරගන්නා මහෞෂධ කුමරු ළමා වියේ සිටම සිය නැණවත් බවත් යහපත් ගතිගුණත් ප්‍රකට කළ ආකාරය උම්මග්ග ජාතක කථා වස්තුව පුරාම අපට හඳුනාගත හැකිය. මෙම කථා වස්තුවෙහි අන්තර්ගත විවිධාකාර සිදුවීම් මෙන්ම ඉතා සංකීර්ණ වූ ද, ඇතැම් විට පුදුම සහගත වූ ද සිද්ධීන් කථා රසය මතු වන සේ දැක්වෙන ආකාරය ද පැහැදිලිය. රජුන්, ක්ෂත්‍රියයන්, බමුණන් මෙන්ම සාමාන්‍ය ජනයා ද මෙම කථා ප්‍රවෘත්තිය තුළ දක්නට ලැබෙන චරිත වන අතර ඔවුන්ගේ හැසිරීම් හා ක්‍රියාදාමයන් යහපත හා අයහපත මිශ්‍ර වූ සංකීර්ණ ඒවා බව ද පෙනේ.

ඒ අතර 'ගොවියා පුතු' යන නමින්, පරිභවයෙන් යුතු ආකල්පයක් සහිතව හඳුන්වනු ලැබූ මහෞෂධ, සාමාන්‍ය ජනයා නියෝජනය කරමින්, වරදට එරෙහිව නැගී සිටිමින්, යහපතටම යොමු වෙමින් සිය ඥානවන්ත භාවය ඔප්පු කරමින්, පොදුවේ සැමට මහඟු සේවයක් කරමින් හැදුණ වැඩුණ ආදර්ශවත් චරිතයක් ලෙස මතු කර පෙන්වීමට ජාතක කතාකරුවා යොමු වී තිබීම දර්ශන රත්නායක ලේඛකයා ද සිය අවධානය යොමු කළ විශේෂ කරුණකි.

සිය කාව්‍ය ග්‍රන්ථය අරඹන කතුවරයා මුලින්ම ඥානවන්ත භාවයෙහි වැදගත්කම සරල පද්‍යයකින් මෙසේ දක්වා ඇත.

"සිරි සෙත වලඳවන
සරතැස නිවන සෙවණයි
මනුසත පලඳවන
අමිල සිතුමිණි රුවන නුවණයි"
(නැණසිළුමිණ, 1 පද්‍යය)

මනුෂ්‍ය වර්ගයාට වඩාත්ම වැදගත් වන, එමෙන්ම මිල කළ නොහැකි වන්නා වූ ද සිතුමිණි රුවන නම් නුවණයි. ඥානය මිනිස් වර්ගයාගේ දියුණුවට, ඉදිරිගමනට අත්‍යවශ්‍ය මෙන්ම ඉතා වැදගත් වන්නා වූ ද සාධකයයි. නුවණින් හෙබි පුද්ගලයින් සමාජයේ යහපතට කටයුතු කරන්නා සේම, නුවණින් හීන පුද්ගලයා සමාජ පරිහානියට හේතු වන සේ ක්‍රියා කරනු ඇත යන්න කාහට වුවත් ගැටලුවකින් තොරව පිළිගත හැකි කරුණකි. මෙවන් යහපත් කරුණකින් සිය නිර්මාණය අරඹන දර්ශන රත්නායක කතුවරයා අනතුරුව, උමංදාවට වස්තු වන කථා පුවත්හි නායක චරිතය වන මහෞෂධ පඬිවරයා ගැන තව දුරටත් කවියෙන් වැදගත් කරුණු කිහිපයක්ම ගෙනහැර දක්වයි.

"මහඔසු පඬිඳු සඳ
වී ලොවට නැණ සිළුමිණ
සතුරු බලමුළු බිඳ
වැජඹුණා සුරකිමින් නැණගුණ"
(නැණසිළුමිණ, 2 පද්‍යය)

අනතුරුව සිය නිර්මාණ කාර්යය ගැන ද කියවෙන සේ කතුවරයා තවත් සරල, එමෙන්ම රසවත් කවි තුනකින් මෙහි මුවදොර සරසා ඇත. එම සිරිත, නැතහොත් මහෞෂධ චරිතය මුල් කරගනිමින් සිදු කොට ඇති මෙම අර්ථවත් කාව්‍ය රචනය ගැන ද සඳහන් කර ඇත. මෙලෙසින් 'කවි සුවඳහැල් කෙත' සරසාර වෙමින් එතුමාගේ නිර්මාණය බිහි වී ඇති ආකාරයට 'මුවදොර' කවි පහ දෙස් දෙයි.

තම කාව්‍ය නිර්මාණ කෘතිය සැලසුම් කිරීමේදී ද කතුවරයා එහි අනුකොටස් නම් කර ඇත්තේ, 'පළමුවෙනි ගැබ', 'දෙවෙනි ගැබ', 'තෙවෙනි ගැබ', 'සිව්වෙනි ගැබ' යනාදී වශයෙන් කොටස්, නැතහොත් පරිච්ඡේද දහඅටකට බෙදා වෙන් කරගනිමිනි. මෙම බෙදීම මෙන්ම, ඒ එක් එක් කොටසට දී ඇති විස්තරාත්මක හැඳින්වීම් ද මෙම කාව්‍ය රචනයෙහි විශේෂත්වයක් ප්‍රකට කරයි. නිදසුන් ලෙස දක්වතොත්, 'කුමරු රුව ගුණ නුවණ මුසුවකි', 'ව්‍යසයි යළි දැල්වෙන ගිනිසිළුව', 'සිදුකොට සුබ සරණ මගුල්', 'නොකියති රහස් නුවණැත්තෝ කිසිවකුට', 'සිය රට සුරකින මෙහෙවර', යනාදී වශයෙන් එකී හැඳින්වීම් ද කාව්‍යමය ලෙසකින් ඉදිරිපත් කරමින්, එක් එක් පරිච්ඡේදයේ අන්තර්ගත ප්‍රධාන සිදුවීම ද ඇතුළත් වන සේ යොදා තිබීම රසවත් මෙන්ම අර්ථවත් වූ ද ක්‍රමෝපායයක් ලෙස දැකගත හැකිය.

ඕනෑම කවියකු තමන් අතින් බිහි වන නිර්මාණයක් මගින් සහෘදයා තුළ රස ජනනය කළ යුතුය යන්න අමුතුවෙන් කිව යුතු නොවේ. මහෞෂධ කතා පුවත පාඨකයාට පහසුවෙන් තේරුම් ගැනීමට හැකි වන පරිදින්, එම කවි මගින් සහෘද මනස රස ගැන්වෙන පරිදින් කළ යුත්තේ කෙසේද යන්න පහසුවෙන් තේරුම් ගැනීමට මෙම කතුවරයා සමත් වී ඇත. බුදු දහමට, බුදු සිරිතට මෙන්ම විශේෂයෙන්ම ජාතක සාහිත්‍යයට ද ඇලුම් කරන බෞද්ධ ජනතාව මෙලෙසින් සරළවත් රසවත්වත් නිර්මාණය වන කාව්‍ය ග්‍රන්ථයක් කියවා බැඳීමට පසුබට නොවන බව ඒකාන්තය. අනවශ්‍ය ලෙස දුෂ්කර බන්ධන යොදාගැනීම් වැනි උපක්‍රම මගින් සිය නිර්මාණ ග්‍රන්ථය පාඨකයාට කියවා තේරුම් ගැනීමට අපහසු නොවන කෘතියක් බවට පත් කර ළිම දර්ශන රත්නායක මහතාගේ අභිලාෂය වී ඇත.

"දිනිඳු සුර කුමරු
වඩින උළෙලට සොඳුරු
සිනිඳු තරු පොකුරු
නැමැති අසෙනිය කුසුම් ඇතිරූ"
(31 පිට, 6 පද්‍යය)

කාව්‍යමය ගුණයෙන් අනූන වන සේ, වර්ණනාත්මක යෙදුම් සහිත පද සංයෝජනයකින් යුතුව, කතුවරයා මෙම කෘතියෙහි පැරණි සාහිත්‍ය නිර්මාණවල ස්-